# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් 2026.07.03 දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

**ස්ථිර තනතුරු:**

1. වෛද්‍ය අධ්‍යාපන අංශයේ කථිකාචාර්ය (පරිවාස), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය Gr.II/I

(අයදුම්කරුවන් සතුව MBBS උපාධියක් තිබිය යුතු අතර, සෞඛ්‍ය තොරතුරු විද්‍යාව (Health Informatics) පිළිබඳ මණ්ඩල සහතිකය සහිත MD උපාධියක් ලබා ඇති අයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

**වැටුප් පරිමාණයන් :**

අ) **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය Gr. I —** රු.160,520 - 7X3,900 - 187,820 මසකට (U-AC 3 (I) වැටුප් පරිමාණය 2025.01.01 )

ආ) **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය Gr. II —** රු.138,980 - 11X2,940 - 171,320 මසකට (U-AC 3 (II) වැටුප් පරිමාණය 2025.01.01 දිනට අනුව)

ඇ) **කථිකාචාර්ය (ස්ථිර නොකළ) —** රු.121,340 - 5X2,940 - 136,040 මසකට (U-AC 3 (III) වැටුප් පරිමාණය 2025.01.01 දිනට අනුව)

ඈ) **කථිකාචාර්ය (පරිවාස) —** රු.94,400 - 10X2,400 - 118,400 මසකට (U-AC 3 (IV) වැටුප් පරිමාණය 2025.01.01 දිනට අනුව)

ඉහත වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් අනුමත දීමනා ද ගෙවනු ලැබේ.

**සප්ත වාර්ෂික නිවාඩු හිමිකම**

ඉහත තනතුරු දරන්නන් වසර හතක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු පූර්ණ වැටුප් සහිත වසරක හෝ වැටුප් රහිත වසර දෙකක සප්ත වාර්ෂික නිවාඩුවක් සඳහා සුදුසුකම් ලබයි.සප්ත වාර්ෂික නිවාඩු ලබා විදේශගත වන අයට තමා සහ තම කලත්‍රයා සඳහා පූර්ණ ගුවන් ගමන් ගාස්තු ලැබීමට හිමිකම් ඇත.

**වැදගත්**

ඔබගේ වෘත්තීය, අධ්‍යාපනික සහ අනෙකුත් සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික පත්‍රවල ඡායා පිටපත් අයදුම්පතට අමුණන්න.

උසස් අධ්‍යාපන ආයතන, රජයේ දෙපාර්තමේන්තු සහ රජයේ සංස්ථා නිලධාරීන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රැකියා විස්තර සහ අයදුම්පත ඇතුළු වැඩිදුර තොරතුරු වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෙබ් අඩවියෙන් (pgim.cmb.ac.lk) ලබාගත හැක.

**අයදුම්පත් භාරදීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් ද සමඟ 2026.07.03 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ, saradmin@pgim.cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට, නැතහොත් ගෙනවිත් භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ ආයතන සහ පොදු පරිපාලන ශාඛාව, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07"** යන ලිපිනයට එවිය යුතුය.

අයදුම් කරන තනතුර විද්‍යුත් තැපැල් 'ශීර්ෂය' ලෙස හෝ ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**අංක 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,**
**කොළඹ 07.**
**2026.06.14**